www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය

## *1.,2 හා 3 පරිච්ඡේද*

**Marxism, History & Socialist Consciousness Chapters 1,2 & 3**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

*හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත* Marxism, History & Socialist Consciousness *(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. ඊයේ අපි එම ග්‍රන්ථයේ පෙල කොටස් වසයෙන් පල කිරීම ආරම්භ කලෙමු. එහි පෙරවදන ඊයේ පල විය. 1. 2 හා 3 වන පරිච්ජේදයන් පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පල කරනු ලැබ ඇත.*

### 1. හැඳින්වීම

හිතවත් ස්ටයිනර් සහ බ්‍රෙනර් සහෝදරවරුනි,

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව " වෛෂයිකවාදය සහ මාක්ස්වාදය" යන ඔබේ ලියවිල්ලට, මා එම සංවිධානය වෙනුවෙන් පිලිතුරු ලිවිය යුතු යයි අනවා ඇත. මෙය වනාහි මා කිසියම් ප්‍රමානයක කනගාටුවකින් යුතුව බාරගන්නා වැඩකි. පසු ගිය දශක තුනක් තිස්සේ අපගේ ජීවිත වෙනස් මාවත් ගත් නමුදු, අපගේ ව්‍යාපාරය තුල අප සමීපව එකට වැඩ කල සමය පිලිබඳ උනුසුම් මතකයන් මා තුල තවමත් ඉතිරිව පවතී. කෙසේ වෙතත්, ඒ ඉතා ඈත අතීතයයි; එපමනක් නො ව ඔබේ අලුත්ම ලිපිය කරන්නේ ගත වූ අවුරුදු කිහිපයක් තිස්සේ ඔබගේ විවිධ ලියවිලි වඩ වඩාත් ඉස්මතු කලා වූ දෙය අවධාරනය කිරීමට ආධාර කිරීම පමනි; එනම් ඔබ මාක්ස්වාදයෙන් ද, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ දේශපාලන උරුමයෙන් ද, ජාත්‍යන්තර කමිටුවෙන් ද දේශපාලනිකව බොහෝ ඈතට ගමන් කර ඇති බව යි. මෙම අපලායනීය (පලා යා නො හැකි) දේශපාලන යථාර්ථය විසින් අපගේ මෙම පිලිතුරේ අන්තර්ගතය සහ තානය නීර්නය කෙරෙනු ඇත.

ඔබගේ ලිපිය ඇරඹෙන්නේ ඔබ කලින් ලියූ ලේඛනයන්ට පිලිතුරු දීමට හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව අසමත්ව ඇති බව සඳහන් කරමිනි; ඉන් ඔබ අතිශයින් ම කලඹනසුලු නිගමනයන්ට එලඹෙන්නාහුය: හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව "විවේචනය කෙරේ අප්‍රියතාවයකින්" පෙලෙයි, මෙය "ව්‍යාපාරය තුල වඩාත් ගැඹුරු ගැටලු පිලිබඳව ලාක්ෂනික වන අතර ජාත්‍යන්තර කමිටුවේ සෑම සාමාජිකයෙක් ම ඒ ගැන සන්තාප විය යුතු ය." ව්‍යාපාරයේ නායකත්වය "දේශපාලන විවාදයට ගල් පවුරු බඳී"; "තමන්ට විවේචනයෙන් බේරීම සඳහා සාකච්ඡා වලක්වා දැමීමට ද යත්න දරයි." ඔබගේ ලේඛනවලට ඔබ කියන පරිදි ඔබට ප්‍රතිචාර දැක්වීමට අප අසමත්වීම විසින් "අවධාරනය කෙරෙන්නේ ව්‍යාපාරය තුල සැබෑ විවේචනාත්මක විවාදය කොතරම් විරසත භාවිතයක් බවට පත්ව ඇතැයි ද යන්නය."

ඔබ විසින් විස්තර කරනු ලබන තත්වය අසංනිවේදිත නිරීක්ෂකයෙකුගේ සිතට ගෙනෙනු ඇත්තේ ඒකාධිපති දේශපාලන පක්ෂයක් තුල, දඬු ගසනු ලැබූ විපාර්ශවීය ප්‍රවනතාවයක් තමන්ගේ අදහස් අනුගාමිකත්වයට ඉදිරිපත් කිරීමට ඇත්තා වූ ප්‍රජාතන්ත්‍ර අයිතිය නිලධාරි තන්ත්‍රය විසින් පාගා දමනු ලැබීමකට එරෙහිව සටන් වැද සිටින ආකාරයකි. එහෙත් ඔබ දෙදෙනාම මැනවින් දන්නා පරිදි යථාර්ථය මීට බෙහෙවින් වෙනස් ය. ඔබ දෙදෙනාගෙන් එක් අයෙකු වත් සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකයෝ නො වෙති. ඔබ දෙදෙනා සසපයෙන් පිට වී අවුරුදු 28 ක් පිරීමට ඉතා ආසන්න ය.[1] මෙය යම් වැදගත්කමක් දරනවා ම ය. ඔබ, "ව්‍යාපාරය සමග දීර්ඝ ඉතිහාසයක්" ගැන කරන සඳහන ස්වයං-ලජ්ජිතව දෙබිඩි අර්ථයක් දරන්නා වූ විස්තරයකි. "තුල" හා "සමග" යන දෙ පද වෙනස් අර්ථ දරයි. ඔබගේ වැඩිහිටි ජීවිතයෙන් වැඩි කාලයක් ඔබ පක්ෂ සාමාජිකයන් ව සිට නැත. ඔබ ව්‍යාපාරය සමග සුහද-මිත්‍රශීලී සම්බන්ධයක් පවත්වාගෙන ගොස් ඇතැ යි යන හුදු කාරනය උඩ, සමාජවාදී සමානතා පක්ෂයේ හෝ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවල සාමාජිකයන්ගේ ලියවිලිවලට ප්‍රතිචාර දක්වන ආකාරයට ඔබේ ලේඛනවලට ද ප්‍රතිචාර දැක්වීමට අප බැඳී සිටින්නේ නැත.

අපගේ ව්‍යාපාරයේ ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ගය විවේචනය කොට ඔබ ලියන දෑ සියලු දෙනාට ම කියවා ගත හැකි පරිදි ඔබගේ ම වෙබ් අඩවියේ (අන්තර්ජාලය දේශපාලන සංනිවේදනයේ පූර්න-සුජාත විධියක් ලෙස ඔබ විසින් ප්‍රතික්ෂේප කිරීම ලෙස පෙනී යන දෙය සැර බාල කර ගැනීමට ඔබ ම සූදානම් වන ප්‍රමානයට) පල කර ගැනීමෙන් ඔබව වැලැක්වීමට ජාත්‍යන්තර කමිටුවේ කිසිවෙකුත් ක්‍රියා නො කරනු ඇත. ඔබ හා සම අදහස් දරන උදවියගේ සහාය

එක්රැස් කර ගෙන ඔබගේ ම අදහස් සඳහා ක්‍රියාන්විත වීමට නිදහස ඔබට තිබේ.

එසේ ම ජාත්‍යන්තර කමිටුවේ හා සසපයේ අපට, උචිත යයි හැඟෙන පරිදි ඔබගේ ලිපි ලේඛනවලට පිලිතුරු දීම හෝ නො දී සිටීමට අපේ දේශපාලන අයිතිවාසිකම් අනුව අයිතියක් ඇත. හතර වන ජාත්‍යන්තරයේ සම්ප්‍රදායට හා ක්‍රියා මාර්ගයට විරුද්ධ වූ ඉදිරි දර්ශනයක් සඳහා වේදිකාවක් ඔබට සපයා දීම අපේ වගකීමක් නම් නො වේ. ඔබ විසින් ප්‍රසිද්ධියේ කර ඇති විවේචනවලට මෙම පිලිතුර ඉදිරිපත් කිරීමේ දී ජාත්‍යන්තර කමිටුව "නීතිමය" වගකීමක් සපුරාලනවා නො වේ; අප කරන්නේ මාක්ස්වාදී සමාජවාදය සහ - ඔබ, ස්ටයිනර් සහ බ්‍රෙනර් යන සහෝදරවරුන් දෙදෙනා විසින් පරිග්‍රහනය කරනු ලැබ තිබෙන මධ්‍යම පන්තික දෘෂ්ටිවාද රූපයක් වන ව්‍යාජ-යුතෝපියානු (මනෝරාජක) වාදය අතර පවත්නා ගැඹුරු හා අති මූලික භේදය පැහැදිලි කිරීම ය.

## 2. ජාත්‍යන්තර කමිටුව සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය

ඔබ දෙදෙනා දශක තුනක් පමන කාලයක් තිස්සේ අපගේ ව්‍යාපාරයේ සාමාජිකයන් ලෙස සිට නැති නමුත්, ඔබ දෙදෙනාට එහි අභ්‍යන්තර ජීවිතය පිලිබඳ දැනුමක් නැති නමුත් ඔබ ජාත්‍යන්තර කමිටුවට සාතිශය පෘථුල චෝදනා කරන්නාහු ය. "ව්‍යාපාරය තුල සිත් කලබලයට පත් කරන්නා වූ, සංවිහිත න්‍යායික හෝ දේශපාලන සාකච්ඡාවක් නැති කමක්, පවත්නේ යයි" ඔබ කියන්නාහු ය. මෙම කියා පෑම පදනම් වී ඇත්තේ කුමක් මත ද? ඔබගේ ලේඛනවලට අප සැලකූ ආකාරය ගැන ඔබට ඇති අමනාපය හැරෙන්නට, අපගේ දේශපාලන වැඩ කටයුතු තුල මෙම න්‍යායික සහ දේශපාලන පිරිහීම ප්‍රකාශිතව ඇත්තේ කෙසේ ද? මෙය වනාහි ඔබ විසින් පිලිතුරු නො සැපයෙන ප්‍රශ්නයකි. ජාත්‍යන්තර කමිටුව ඔබගේ ලිපිවලට උචිත තරම් වූ අවධානයක් යොමු කලේ නැති නම්, - එවන් වරදක් ඇත්ත වශයෙන් ම කරන ලද්දේ වුව ද - එය ම ගත් කල ලෝක ඓතිහාසික සිද්ධියක මට්ටමට ඉහල නො නගිනු ඇත. එසේ වූවත්, ඔබගේ චෝදනාව සහ ඔබට පරිබාහිර වූ ලෝක වර්ධනයන්ට සම්බන්ධ වූ වඩාත් බැරෑරුම් දේශපාලන ගැටලු අතර සම්බන්ධයක් පවතින්නේ යයි ඔබ විසින් විදහා දැක්විය යුතුව ඇත. ඔබ විසින් එසේ කියාපෑම පමනක් සෑහෙන්නේ නැත. ඔබ එය ඔප්පු කල යුතුව ද ඇත. මාක්ස්වාදී ව්‍යාපාරයේ ඉතිහාසය තුල මෙවැන්නක් ඉටු කරනු ලැබ ඇත්තේ විවේචනයට ගෝචර වූ සංවිධානයේ දේශපාලන පිලිවෙත සුපරීක්ෂ හා පූර්න විශ්ලේෂනයකට භාජනය කිරීම මගිනි.

ඔබ මෙම න්‍යායාත්මකව සප්‍රපත්තික පිලිවෙත අනුව කටයුතු කිරීමට තෝරා ගත්තාහු නම් ඔබට හස්තගත කර ගැනීමට සුලුපටු නො වන ද්‍රව්‍ය සම්භාරයක් පවතී. පසු ගිය 20 වසර අති මහත් විපර්යාසයන් දැක ගෙන ඇත; තාක්ෂනය, ලෝක ධනවාදයේ ව්‍යුහය, ජාතික රාජ්‍යයන් ගෝලීය ආර්ථිකය කෙරේ දරන සම්බන්ධතාවය සහ අප විසින් සියල්ලටත් වඩා අමතක නො කල යුතු ම දෙය වන ලෝකයේ දේශපාලන භූගෝල ශාස්ත්‍රයේ ඇති වූ මහා වෙනස්වීම් මේවාට ඇතුලත් ය. අවුරුදු 20කට පෙර මුද්‍රනය කලා වූ සිතියම් දැන් පලක් නැත. මේ සියලු ම අන්තර්සම්බන්ධිත සන්තතීහු - තාක්ෂනික, ආර්ථික සහ දේශපාලන - ජාත්‍යන්තර පන්ති අරගලය මත ප්‍රගාඪ බලපෑමක් ඇති කලෝ ය. මෙම ඓතිහාසික වෙනස්කම්වලට ජාත්‍යන්තර කමිටුව දැක් වූ ප්‍රතිචාරයෝ පහසුවෙන් ම වෙලුම් දුසිම් ගනනක් පුරවාලනු ඇත.

කෙසේ වෙතත්, ඔබගේ ලේඛනයේ කොතැනක හෝ දක්නට නැති දෙය නම් දේශපාලන පිලිවෙත පිලිබඳව විශ්ලේෂනයක් තබා ජාත්‍යන්තර කමිටුවේ දේශපාලන පිලිවෙත පිලිබඳ සමර්පනයක් (සැඳැහුමක්) පවා එහි නො තිබීම ය. "ඉරාක යුද්ධය", "බුෂ් පාලනාධිකාරය", "සැප්තැම්බර් 11", "චීනය", "ඇෆ්ගනිස්ථානය", "ඉරානය", "ත්‍රස්තය" හෝ "ගෝලීයකරනය" යන වචන පවා කෙනෙකුට එහි දැක ගත නොහැකි ය. මේවා අපරීක්ෂාකාරී අමතක කිරීම් නො වේ. ඔබ දේශපාලන විශ්ලේෂනය හෝ ඉදිරි දර්ශන පිලිබඳව, අඩු වසයෙන් මෙම උත්සුකයන් හතර වන ජාත්‍යන්තරය තුල වටහා ගැනී ඇති ආකාරය පිලිබඳව හෝ, උනන්දු නැත. *මෙයට මුලුමනින් ම ප්‍රතිකූලවඃ ඔබ විශ්වාස කරන්නේ මාක්ස්වාදී දේශපාලන විශ්ලේෂනය හා අර්ථකථනය කෙරේ ජාත්‍යන්තර කමිටුව සංකේන්ද්‍රනය වීම ම අතිමූලික වරදක් යයි කියා ය. ඓතිහාසික භෞතිකවාදී විධික්‍රමය මත පදනම් වූ මෙවන් විශ්ලේෂනය සහ අර්ථකථනය සමාජවාදී විඥානයේ වර්ධනයට අත්‍යවශ්‍ය යයි, නැත හොත් අඩු වසයෙන් අදාල යයි යන සංකල්පය ඔබ දැඩි සේ ප්‍රතික්ෂේප කරන්නෙහි ය.* මෙම ආස්ථානය ලෝක සමාජවාදී වෙබ් අඩවිය කෙරේ ඔබේ තික්ත විරෝධයට යටින් දිවෙයි. ඔබ විශ්වාස කරන්නේ ජාත්‍යන්තර කමිටුව තුල වැරදි යයි ඔබ විශ්වාස කරන සියල්ලේ ප්‍රධාන ප්‍රකාශනය නම් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* බව යි.

ඔබ මෙසේ ලියන්නෙහි යඃ "සකල අර්ථයෙන් හා අධ්‍යාසයෙන්ම ජාත්‍යන්තර කමිටුව ක්‍රියාත්මක වීම ඇනහිට ඇත." මෙම නිගමනය පදනම් වී ඇත්තේ කුමක් මත ද? "ජාත්‍යන්තර කමිටුව තමන්ගේ ම නමින් රැස්වීමක් පැවැත් වූ අවසාන අවස්ථාව මතක් කර ගැනීම පවා අමාරු ය." "දැන් අවුරුදු ගනනාවක් තිස්සේ ව්‍යාපාරයේ සියලු සාධිකාර ප්‍රකාශයන් නිකුත් කර තිබෙන්නේ *ලෝසවෙඅ* ප්‍රකාශන හැටියට ය. දැන් ඕස්ට්‍රේලියාවේ පැවැති හමුව - එය පැහැදිලිව ම ව්‍යාපාරයේ ජාත්‍යන්තර සම්මේලනයක් විය - ඉදිරිපත් කෙරෙන්නේ විප්ලවවාදී පක්ෂයේ නාමයෙන් නො ව වෙබ් අඩවියක කර්තෘ මන්ඩලයේ රැස්වීමක් ලෙස ය."

එපමනක් නො වේ. ඔබ මෙසේ ද අසන්නෙහි ය: "ජාත්‍යන්තර කමිටුව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ලෙසට රූපාන්තරකරනය කවර කලෙක වත් පක්ෂ සම්මේලනයක දී සාකච්ඡා කර ඡන්දයකින් තීන්දු කරනු ලැබුවේ ද?" සහ, "මෙතරම් වැදගත් මාරුවක් සඳහා හේතු කම්කරු පන්ති ජනයාට පැහැදිලි කරන්නා වූ ලේඛනය කොහි ද? විප්ලවවාදී ජාත්‍යන්තරවාදයේ සංවිධානාත්මක ප්‍රකාශනය මේ ආකාරයට හමස් පෙට්ටියට දැමීම ඒ සමග ම පුනපුනා නිවේදනය කෙරෙන ජාත්‍යන්තරවාදය හා සමහන් කරන්නේ කෙසේ ද?"

"ජාත්‍යන්තර කමිටුව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* බවට රූපාන්තරකරනය" ගැන ඔබ කතා කරන්නේ හරියට ම *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ආරම්භ කිරීම තුල කිසියම් අවජාතක යටිකුට්ටු දෙයක් තිබුනාක් මෙනි. මෙහි ලා ඔබේ ප්‍රහාරය සමීපව සමාන්තරගත වන්නේ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පිහිටුවීමට ස්පාටසිස්ට් ලීගය දැක් වූ ප්‍රතිචාරය සමග ය.[2] එහෙත්, ඔබ *ලෝසවෙඅ* ආරම්භ කිරීම ජාත්‍යන්තර කමිටුවේ දේශපාලන පිලිවෙතේ වෙනසක් හා සම්බද්ධ වී යයි කොතැනක දී වත් කියා නැත. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට පවත්නා දේශපාලන සම්බන්ධය කුමක් දැයි ඔබට සැකයක් තිබිය හැකි නමුත් එම සම්බන්ධතාවය දහස් ගනන් වූ එහි දෛනික පාඨකයන්ට නම් අබිරහසක් නො වේ. එතකුදු නොව, මාක්ස්ගේ *නියු රෙයිනිෂේ සයිටුං* පුවත් පතේ පටන් ම විප්ලවවාදී ප්‍රවනතාවයක න්‍යායික හා ක්‍රියා මාර්ගික අනන්‍යතාව එහි ප්‍රකාශනය සමග සමානාර්ථව පැවතී ඇත. ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ *නියු ෂෙයිට්* ද, ලෙනින්වාදීන්ගේ *ඉස්ක්‍රා*, *වපරයොද්*, සහ *ප්‍රව්ඩා* ද, සෝවියට් සමූහාන්ඩුවේ ස්ටැලින්වාද විරෝධී විපාර්ශවයේ *බුලටිනය* ද, 1920 ගනන් හා 1930 ගනන්වල ඇමරිකානු ට්‍රොට්ස්කිවාදීන්ගේ *මිලිටන්ට්* හා *සෝෂලිස්ට් ඇපීල්* නම් පසුකාලීන පුවත් පත ද බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන් බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂය තුල නිෂ්පාදනය කල *නිව්ස් ලෙටර්* පමනක් නොව වර්කර්ස් ලීගයේ *බුලටින්* පුවත් පත පවා ද අපගේ ලැයිස්තුවට ඇතුලත් කල හැකි ඒවා ය. ලෝකය පුරා දහස් ගනන් පාඨකයන් විසින් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සමාජවාදී ජාත්‍යන්තරවාදයේ අව්‍යාජ කටහඬ ලෙස දක්නේ ය යන කාරනය නිසා සිත් කරදර කර ගැනීමට අපට ඇති හේතුවක් නැත.

*ලෝසවෙඅ* කෙසේ හෝ ජාත්‍යන්තර කමිටුවට හොරා පිහිටුවනු ලැබ ඇතැ යි යන ඔබගේ යෝජනාව බැලූ බැල්මටම විකාරයකි. ඔව්, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ආරම්භ කිරීම පිලිබඳව ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන ලදි. ඔබ ඒ ගැන උනන්දු නම් ඔබට එම ප්‍රකාශයට තව මත් පිවිසිය හැකි වේ.[3] ඔබ මේ ප්‍රශ්නය අසා තිබෙන නිසා කිව යුතුව ඇත්තේ, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පිහිටුවීම සැබැවින් ම අවුරුද්දක් තරම් කාලයක් පුරා ජාත්‍යන්තර කමිටුවේ සෑම ශාඛාවක්ම තුල කර ගෙන යන ලද දැඩි සාකච්ඡාවක් පෙරටු කර ගත් බව ය. එසේ නො වී නම් පසු ගිය අවුරුදු අටහමාරක් තුල *ලෝසවෙඅ* නොකඩවා දිනපතා ප්‍රසිද්ධ කිරීම සඳහා ලද ඉහල මට්ටමක ආධාරය හා සහභාගිත්වය කෙසේ ලබා ගත හැකිව තිබුනි ද? 1998 පෙබරවාරි මාසයේ *ලෝසවෙඅ* ආරම්භ කිරීමේ පටන්, ජාත්‍යන්තර කමිටුවේ මූලධර්ම, ඉතිහාසය, න්‍යායික දෘෂ්ටිය හා ඉදිරි දර්ශනය මත පදනම් වූ නිරන්තරව පලල් වන මාක්ස්වාදී ලේඛක කාර්යධරයක සාමූහික වැඩ කටයුතු මෙහෙයවන ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයක් විසින් ලිපි 18,000කට වැඩි ප්‍රමානයක් පල කරනු ලැබ ඇත. න්‍යායේ දී මෙන් ම භාවිතාවේ දී ද *ලෝසවෙඅ* නියෝජනය කරන්නේ විප්ලවවාදී ජාත්‍යන්තරවාදයේ වර්ධනයේ ඓතිහාසික සැතපුම් කනුවකි. පෞද්ගලික ආත්මීයවාදය විසින් ඔද්දල් කරනු ලැබූ ඔබේ දේශපාලන අන්ධභාවය විසින් "විප්ලවවාදී ජාත්‍යන්තරවාදයේ සංවිධානාත්මක ප්‍රකාශනය හමස් පෙට්ටියට දැමීම" ක් ගැන කතා කිරීමට, ඔබ මෙහෙයවනු ලැබ සිටින්නේ ඉංග්‍රීසි, ප්‍රන්ස, ජර්මානු, ඉතාලි, ස්පාඤ්ඤ, පෘතුගීසි, රුසියානු, පෝලන්ත, සර්බෝ-ක්‍රොආසියානු, තුර්කි, සිංහල, දෙමල සහ ඉන්දුනීසියානු යන භාෂා 13න් අර්ථ කථනයන් සම්පාදනය කරන වෙබ් අඩවියක් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව දිනපතා පවත්වා ගෙන යාම මෙහෙයවන තතු තුල ය. මෙය ඔබගේ සිත තුල නියෝජනය කරන්නේ "සකල අර්ථයෙන් හා අධ්‍යාසයෙන්" ජාත්‍යන්තර කමිටුව අවසාන වීම නම්, සැබෑ ජාත්‍යන්තර කටයුතු සමන්විත වන්නේ කුමකින් දැයි යන්න ගැන ඔබ සිතන්නේ මොනවා දැයි කියා කෙනෙකුට පුදුම විය හැකි ය. දශක තුනකට පෙර, ඔබ ව්‍යාපාරයේ සාමාජිකයන්ව සිටි සමයේ ජාත්‍යන්තර කමිටුවේ අභ්‍යන්තර ජීවිතය සමන්විත වූයේ අනුබද්ධ හෝ සහයෝගී ශාඛාවන්හි නියෝජිතයන් ලන්ඩන් නුවර පිහිටි කම්කරු විප්ලවවාදී පක්ෂ කාර්යාලයට විටින්විට කල ගමන්වලට නො වැඩි දෙයකිනි. හතර වන ජාත්‍යන්තරයේ නාමික ලේකම් වූ ක්ලිෆ් ස්ලෝටර් ජාත්‍යන්තර කාර්යධරය සමග නිරන්තර සම්බන්ධතාවයක් පැවැත්වූයේ නැත. ජාත්‍යන්තර කමිටුවේ ඉදිරි දර්ශනය පිලිබඳව සහක්‍රියාකාරිත්වය පසෙක තිබියේවා අඩු ගනනේ ක්‍රමානුකූල සාකච්ඡාවක් හෝ කෙරුනේ නැත. ජාත්‍යන්තරවාදය පිලිබඳ ඔබගේ සංකල්පය හීලිගේ සංවිධානයේ ආන්තික පරිහානිය සිදු වූ සමයේ හැඩ ගැසුනු තාක් දුරට, ඔබ දෙදෙනාගෙන් එක් අයෙකුට හෝ තම දෛනික දේශපාලන ක්‍රියාකාරිත්වය අතිශයින් ම දෘඪ ජාත්‍යන්තර සහක්‍රියාකාරිත්වයෙන් සමන්විත වන්නා වූ ව්‍යාපාරයක් තුල වැඩ කිරීම යනු කුමක් දැයි සංකල්පනය කර ගැනීමට වත් නොහැකි ය.

## 3. ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය සහ ජාත්‍යන්තර කමිටුවේ ඉදිරි දර්ශනයෝ

ගත වූ වර්ෂය ඇතුලත ජාත්‍යන්තර කමිටුව ප්‍රධාන න්‍යායික සහ දේශපාලන ව්‍යාපෘතීන් දෙකක් පැවැත්විය. ඉන් පලමු වැන්න "මාක්ස්වාදය, ඔක්තෝබර් විප්ලවය සහ හතර වන ජාත්‍යන්තරයේ පදනම්" යන්න මත පවත්වන ලද දේශන නවයකි. ඒවා 2005 අගෝස්තු 14-20 අතර මිචිගන්හි, ඈන් ආබර්හි දී පවත්වන ලදි. දෙවැන්න නම්ඃ 2006 ජනවාරි 22-27 ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර දී පවත්වන ලද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල රැස්වීම යි. මෙම සිද්ධීන් කෙරේ ඔබ දක්වා ඇති ප්‍රතිචාරය වනාහි ඔබ විසින් මාක්ස්වාදය අතහැර දැමීම හා ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ දේශපාලන දෘෂ්ටියට හා සම්ප්‍රදායට දැක්වෙන විරුද්ධත්වය පිලිබඳ විනාශකාරී ස්වයං-නිරාවරනයකි.

මෙම රැස්වීම්වල දී ඉදිරිපත් කරන ලද වාර්තා හා දේශනයන්ට ඔබ දැක් වූ ප්‍රකුපිත ප්‍රතිචාරය අපව පුදුමයට පත් කලේ නැත. ඔබගේ ලේඛනවලට ප්‍රතිචාර දැක්වීමට ජාත්‍යන්තර කමිටුවේ අසමත්වීම යයි කියනු ලබන දෙයට ඔබ නිල "විරුද්ධත්වය" දක්වා ඇති නමුත් ජාත්‍යන්තර කමිටුවේ එම ඉදිරිපත් කිරීම්වල දී විස්තාරනය කරන ලද න්‍යායික සංකල්ප හා ඉදිරි දර්ශනයන් වනාහි විල්හෙල්ම් රීක්, අර්නස්ට් බ්ලොක් සහ හර්බර්ට් මාර්ක්‍යුස් යන අයගේ අවමංගත ප්‍රති-මාක්ස්වාදී ව්‍යාජ-යුතෝපියානු (මනෝරාජික) වාදය හතර වන ජාත්‍යන්තරය තුලට කා වැද්දීමට - එනම් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ න්‍යායික හා ක්‍රියාමාර්ගික පදනම් ද පන්ති දිශානතිය ද අතිමූලිකව විපර්යාස කර දැමීමට - ඔබ ගෙන යන ව්‍යායාමය මුලුමනින් ම ප්‍රතික්ෂේප කිරීමක් බව ඔබ පැහැදිලිව ම වටහා ගත්තෙහි ය. ඔබ, "මෙම රැස්වීම්වලින් පිට කෙරුනු දේශන හා වාර්තා විවේචනාත්මක විවාදයකට නව විවෘතතාවක් හඟවන්නේ නැතැ"යි ලියන කල්හි ඔබ සඳහන් කරන්නේ මෙයයි.

කර්තෘ මන්ඩල රැස්වීමේ වාර්තාවන් ඔබ විස්තර කරන්නේ මෙසේ ය. "ඉදිරි දර්ශන ලියවිල්ලක ඡායා මාත්‍රයක් මිස සැබෑ එක (ඉදිරි දර්ශනය) නො වේ; ඒවා මාක්ස්වාදී සායමකින් යුත් විදේශ තොරතුරු වාර්තාවක් මිස විප්ලවවාදී භාවිතාවට මග පෙන්වීමක් නම් නො වේ. ඒවා ඇත්ත වසයෙන් ම කර්තෘ මන්ඩල වාර්තාවන් ය - එනම් තවතවත් පුවත්පත් කලාවේදී කටයුතු සඳහා ඉදිරි දර්ශනයන් ය. විප්ලවවාදී පක්ෂය ගොඩ නැගීමේ අවශ්‍යතාවය පිලිබඳ චාරිත්‍රානුකූල ප්‍රකාශයන් අගට එකතු කිරීමට පිටස්තරව කල යුත්තේ කුමක් ද යන ප්‍රශ්නය ඒවාට කිසි සේත් ම ඇතුලු වී තිබුනේ නැත. වෙනත් වචනවලින් කිව හොත් විප්ලවවාදී ඉදිරි දර්ශනයක සාරය මෙම වාර්තාවල දක්නට නැත. එහෙත් ජාත්‍යන්තර කමිටුව සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කරන දෙය නම් මෙය ම යි."

කර්තෘ මන්ඩල රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද වාර්තාවන් පිලිබඳව ඔබට කීමට තිබෙන දෙයෙහි සම්පූර්න ඓක්‍යය එයයි. සැබැවින් ම ඉදිරිපත් කරන ලද වස්තු විෂයයන් පිලිබඳ මොන ම විශ්ලේෂනයක් හෝ ඇත්තේ නැත. 1953 දී ජාත්‍යන්තර කමිටුව පිහිටු වූ තැන් පටන් එහි රැස්වීමක දී ඉදිරිපත් කරන ලද ලෝක දේශපාලන තත්වය පිලිබඳ අතිශයින් ම පෘථුලව ව්‍යාප්ත පරීක්ෂනය සාමුහිකව ඉදිරිපත් කල එම වාර්තා කෙරේ ඔබ දක්වන නො තැකීම ඔබේ ම දේශපාලන දෘෂ්ටියට සහ පන්ති දෘෂ්ටි ආස්ථානයට දෙස් දෙයි.

ඔබ "ඉදිරිදර්ශන ලියවිල්ලක ඡායාමාත්‍රයක්" ලෙස ඔතරම් ම පිලිකුලෙන් බැහැර කරන ජාත්‍යන්තර කර්තෘ මන්ඩල රැස්වීමේ අන්තර්ගතය අපි සමාලෝචනය කර බලමු. ඔබ විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්තේ ලෝක දේශපාලන සහ ආර්ථික තත්වය පිලිබඳ බහුව්‍යාප්ත හා ඒකාග්‍රිත විශ්ලේෂනයක් මත පදනම් ව ලෝක සමාජවාදී විප්ලවයේ ප්‍රලෝචනය (prospects) සඳහා වෛෂයික පදනම් පිහිටුවා ගැනීමට ජාත්‍යන්තර කමිටුව විසින් දරන ලද ප්‍රයත්නය යි. ලෝක විප්ලවවාදී ඉදිරි දර්ශනයන්ගේ වර්ධනය සඳහා ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය විසින් ගනු ලැබූ ප්‍රවිෂ්ටය හොඳින් ම පැහැදිලි කරනු කල හැක්කේ මගේ ආරම්භක වාර්තාවෙන් දීර්ඝ උද්ධෘතයක් ගෙන හැර දැක්වීම මගිනි.

> දේශපාලන පූර්වඥානයක් සඳහා දරෙන කුමන බැරෑරුම් ප්‍රයත්නයක් වුව ද, වර්තමාන දේශපාලන තත්වය තුල පවත්නා ශක්‍යතාවන් පිලිබඳ කුමන තක්සේරුවක් වුව ද මුලපිරිය යුතු වන්නේ ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික වර්ධනය පිලිබඳ නිශ්චිත හා නිරවද්‍ය වැටහීමකිනි.
>
> ධනවාදයේ ඓතිහාසික වර්ධනය පිලිබඳ විශ්ලේෂනය පහත සඳහන් සාරභූත ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුතු යඃ ධනවාදය ලෝක ආර්ථික පද්ධතියක් ලෙස ගමන් කරමින් පවතින්නේ ආරෝහක (ඉහලට ගමන් කරන) පථයක ද, එය තව මත් එහි මුදුනට නගිමින් පවතින්නේ ද? එසේත් නැත හොත් එය පවතින්නේ පරිහානියට යමින් ද එපමනක් නොව පාතාලයකට ඇද වැටෙමින් ද?
>
> අප මෙම ප්‍රශ්නයට දෙන උත්තරය, අපගේ ප්‍රායෝගික වැඩ කටයුතු තෝරා බේරා ගැනීම සඳහා පමනක් නොව අපගේ ව්‍යාපාරයේ මුලු මහත් න්‍යායික සහ ක්‍රියාමාර්ගික දිශානතිය සඳහා ද අනිවාර්යයෙන් ම ඉතා  දුරදිග යන බලපෑමක් ඇති කරයි. ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික තත්වය පිලිබඳව අපගේ විශ්ලේෂනය නිර්නය කරනු ලබන්නේ, සමාජ විප්ලවය උදෙසා වූ කිසියම් ආත්මීය ආශාවක් විසින් නො වේ. ඒ වෙනුවට විප්ලවවාදී ඉදිරි දර්ශනය මුල් බැසගත යුත්තේ සමාජ ආර්ථික වර්ධනයේ වෛෂයික ප්‍රවනතාවයන් පිලිබඳව විද්‍යාත්මක පදනමක් මත කෙරෙන ඇගැයීමක් තුල ය. අවශ්‍ය සමාජ ආර්ථික පූර්වාවශ්‍යතාවන්ගෙන් වෙන් කර දමනු ලැබූ කල්හි, විප්ලවවාදී ඉදිරි දර්ශනයකට මනෝරාජික නිර්මිතයකට වැඩි දෙයක් විය නොහැකි ය.
>
> එසේ නම් අප ධනවාදයේ ඓතිහාසික වර්ධනයේ

වත්මන් අවධිය කෙසේ වටහා ගන්නේ ද? අශමනීය ලෙස ප්‍රතිවිරුද්ධ සංකල්ප දෙකක් අපි මෙහි දී සැලකිල්ලට බඳුන් කරමු. මාක්ස්වාදී ආස්ථානය නම්, අප දන්නා පරිදි, ලෝක ධනේශ්වර පද්ධතිය අර්බුදයේ උග්‍රතම අවධියකට පත් ව ඇති බව යි. සත්තකින් ම 1914 ලෝක යුද්ධය පුපුරා යාම ද ඉන් ඉක්බිත්තේ එලඹි 1917 රුසියානු විප්ලවය ද ලෝක ඉතිහාසයේ අතිමූලික සන්ධිස්ථානයක් නියෝජනය කලේ ය. ප්‍රථම ලෝක යුද්ධය පුපුරා යාම ද 1945 දෙවන ලෝක යුද්ධය අවසාන වීම ද අතර දශක තුනකට වැඩි කාලයක ප්‍රලයකාරී සිද්ධීහු ධනවාදය එහි ප්‍රගතිශීලී ඓතිහාසික කර්තව්‍යය අවසානයට පත් වීමෙන් ඉක්බිතිව ද පන ගැටගසාගෙන සිටින බවත්, ලෝක ආර්ථිකය සමාජවාදී ව පරිවර්තනය කිරීම සඳහා වෛෂයික පූර්වාවශ්‍යතාවන් ඉස්මතු ව ඇති බවත් විදහා දක්වූහ. ධනවාදය මෙම දශක කිහිපයේ අර්බුදයෙන් පසු රැකී පැවැත්මට සමත් වීය යන කරුන බොහෝ දුරට, මහා ජන පක්ෂයන්හි හා සංවිධානයන්හි නායකත්වයන්ගේ, අන් සියල්ලටමත් වඩා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ, කොමියුනිස්ට් පක්ෂ සහ වෘත්තීය සමිතිවල අසාර්ථකත්වය සහ පාවාදීමේ ප්‍රතිඵලයක් වූයේ ය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක ධනවාදය -- ඒ වනවිට සැලකිය යුතු මට්ටමක පැවති එක්සත් ජනපදයේ සම්පත්වල ආධාරයෙන් -- යලි පුනරුත්ථාපනය වීම ඉහත සඳහන් පාවාදීම්වලින් තොර ව, සිදු කල නො හැකි විය. සත්තකින් ම, පශ්චාත් යුද කාලීන ස්ථාවරකරනය තිබිය දී වුව ද ලෝක කම්කරු පන්තියේ ද පැරනි යටත් විජිතවල පීඩිත ජනතාවගේ ද ධනවාදයට එරෙහි භූගෝල පරිමාන විරෝධය දිගින් දිගටම පැවැත්තේ ය; එහෙත් එම විරෝධයේ විප්ලවවාදී විභවය පැරනි නිලධාරිතන්ත්‍රීය සංවිධාන විසින් යටපත් කරනු ලැබිනි.

අන්තිමේ දී, 1960 ගනන් හා 1970 ගනන්වල මහාජන අරගලයන් පාවාදීම හා පරාජයට පත් වීම ධනේශ්වරයේ ප්‍රතිප්‍රහාරයකට මග පෑදී ය. ධනේශ්වර පද්ධතියේ පෙර නුවූ විරූ භූගෝලීය ඒකාග්‍රකරනයට මග පෑදූ තාක්ෂනික වර්ධනයන් හා ආර්ථික ක්‍රියාකාරිත්වයන් විසින්, ජාතික ඉදිරි දර්ශනයක් මත පදනම් ව පැවැති පැරනි කම්කරු පන්ති සංවිධාන සුන්කර දමනු ලැබීය. ජාතිකවාදී ව්‍යාජ-සමාජවාදයක බංකොලොත් ප්‍රතිමාක්ස්වාදී ක්‍රියා මාර්ගය මත පදනම් වූ, සෝවියට් සංගමයේ සහ නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්හි බිඳවැටීම මෙම ගෝලීකරන සන්තතියේ විපාකයක් විය.

1990 ගනන්වල ධනවාදයේ වේගවත් භෞමික ප්‍රසාරනය තිබියදී ම, ඓතිහාසික අර්බුදය නො නැවතී දිගින් දිගට ම පැවතුනා පමනක් නොව ගැඹුරු ද විය. පැරනි කම්කරු ව්‍යාපාරවලට මාරක බවට පත් වූ ගෝලීකරන සන්තතීහු ලෝක ආර්ථික ක්‍රමයක් හැටියට ධනවාදයේ භූගෝල පරිමාන ඒකාග්‍රිත ස්වභාවය සහ ධනවාදය ඓතිහාසිකව මුල් බැස පවත්නා වූ ද එයට ගැලවීගත නො හැක්කා වූ ද ජාතික-රාජ්‍ය ව්‍යූහය අතර ප්‍රතිසතිතාවය පෙර නුවූ විරූ ආතති සහගත මට්ටමකට ඔසොවා ලූහ. මෙම ප්‍රතිසතිතාවේ සාරභූත නොවිසඳිය හැකි බව - නැත හොත්, අඩුතරමින් මොනයම්මැ හෝ ප්‍රගතිශීලී පදනමක එය "විසඳාලිය නොහැකි බව" වත්මන් ලෝක තත්වය විලක්ෂනය කරන්නා වූ එන්න එන්න ම උග්‍ර වන විපර්යාසය සහ ප්‍රචන්ඩතාව තුල දෛනික ප්‍රකාශනයක් අත් කර ගනී. විප්ලවවාදී මහා පෙරලිවල නව යුගයක් එලඹ ඇත. කෙටියෙන් ගත් කල්හි එයයි මාක්ස්වාදී විශ්ලේෂනය.

ඊට විකල්ප ඉදිරි දර්ශනය කුමක් ද? අප පහත දැක්වෙන ප්‍රති විරුද්ධ උපන්‍යාසය සලකා බලමු.

ලියොන් ට්‍රොට්ස්කිගේ විචිත්‍ර වාක්‍යාංශය යොදාගතහොත්, මාක්ස්වාදීන් 'ධනවාදයේ මරලතෝනිය' යනුවෙන් නම් කල තත්වය, ඊට වෙනස්ව පෙන්නුම් කලේ ධනේශ්වර ක්‍රමයේ ප්‍රචන්ඩ හා දිග්ගැසුනු උත්පත්ති වේදනාවයි. 20 වන ශතවර්ෂයේ විවිධ සමාජවාදී හා විප්ලවවාදී පර්යේෂන වනාහි හුදෙක් නො මේරූ පමනක් නොව සාරභූත වශයෙන් ම මනෝරාජික ද විය. විසි වන ශතවර්ෂයේ ඉතිහාසය වටහාගත යුත්තේ ආර්ථික සංවිධානයේ සුපිරි පද්ධතිය ලෙස ධනවාදය වෙලඳපලේ අනිවාරනීය ජයග්‍රහනයට පැවැති සකල බාධාවන් ජයගැනීම පිලිබඳ කතන්දරය ලෙස ය. සෝවියට් සංගමයේ බිඳ වැටීම ද චීනය වෙලඳපල ආර්ථිකය දෙසට හැරී ගැනීම ද මෙම සන්තතියේ මස්තකප්‍රාප්තිය නියෝජනය කලේ ය. වත්මන් දශකය ද, හොඳට ම සිදු විය හැකි පරිදි ඉක්බිතිව එලඹෙන දශකය ද ආසියාව පුරා ධනවාදයේ වේගවත් ප්‍රසාරනය දිගින් දිගට ම අත් දකිනු ඇත. මෙම සන්තතියේ ඉතාමත් ම අර්ථභාරී අංගය වනු ඇත්තේ චීනය සහ ඉන්දියාව මුහුකුරා ගිය ස්ථාවර ලෝක ධනවාදී බලවතුන් බවට පත් වීම ය.

එපමනක් නො ව මෙම උපන්‍යාසය නිවැරදි නම් -- ඩබ්ලිව්. ඩබ්ලිව්. රොස්ටොව්ගේ ආදර්ශ කල්පිතය අනුව ධනවාදය අවුරුදු 20 ක් ඇතුලත අප්‍රිකාවේ ද මැද පෙරදිග ද "ඉදිරි පිම්මක" අවධියට එලඹෙනු ඇත. නයිජීරියාව, ඇන්ගෝලාව, දකුනු අප්‍රිකාව, ඊජිප්තුව, මොරොක්කෝව සහ ඇල්ජීරියාව ද (මීට අමතරව හෝ මේවා වෙනුවට) වෙනත් රටවල් ද පුපුරා යන ආර්ථික වර්ධනයක් අත් දකිනු ඇත. මේ අනුව මී ලඟ අඩ සියවස තුල දී - සමහර විට 2047 දී (අදින් අවුරුදු 41 පමනක් ගත වූ පසුව) කාල් මාක්ස්ගේ හා ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශනයේ දෙසිය වන සංවත්සරය හුදෙක් ශාස්ත්‍රීයව සිහිකිරීමේ අවස්ථාව එලඹීමට ද පෙරාතුව ලෝක ධනවාදයේ භූගෝල පරිමාන විජයග්‍රහනය සම්පූර්න ද ස්ථිරසාර ද වනු ඇත.

මෙම උපන්‍යාසය වත්මත් සමයේ භූගෝලීය සන්තතීන් වටහා ගැනීම සඳහා යථාර්ථ පදනමක් සම්පාදනය කරයි ද? එය එසේ කරයි නම්, එවිට මාක්ස්වාදයේ විප්ලවවාදී ඉදිරි දර්ශනයෙන් ඉතිරි වන්නේ අල්පමාත්‍රයකි. කම්කරු පන්තියේ ජීවන තත්වයන් පිලිබඳ සියලු උත්සුකයන් අත්හැර දැමීමට අපට ඉන් බල කෙරෙනු නැත. සත්තකින්ම අපගේ උනන්දුවට භාජනවනු ඇති තත්වයන් නො අඩුවනු ඇත. ලෝකයේ දුප්පතුන් හා සූරාකෑමට ගොදුරු වූවන්ගේ තත්වයන් ආරක්ෂා කිරීම සඳහා අවම ඉල්ලීම් මාලාවක් සූත්‍රගත කිරීමට අප උත්සාහ කරනු ඇත.

එහෙත් මෙය වනාහී යම් තරමකට සමාජ මානවහිතවාදයේ ප්‍රයත්නයක් වනු ඇත. කලින් මාක්ස්වාදීන් ව සිටි අයට අඩු වශයෙන් ඓතිහාසිකව පෙර දැකිය හැකි කාලයක් තුල විප්ලවවාදී ව්‍යාපෘතියේ මනෝරාජික ස්වභාවය පිලිගැනීමට සිදු වී තිබෙනු ඇත. ඔවුන්ට මේ අනුව අතීතය පිලිබඳ තම වැටැහීම සැලකිය යුතු ආකාරයකට සංශෝධනය කිරීමට ද බල කෙරෙනු ඇත.

එහෙත් - භූගෝල පරිමානව විජයග්‍රාහී වූ ධනවාදයක් පිලිබඳ - මෙම උපන්‍යාසය යථාර්ථවත් ද? දැනට ම ලෝක ධනේශ්වර පර්යායේ සිතිජය මත දිස්වන පුපුරා යාමේ විභවයක් ඇති බොහෝ ගැටලු එම පර්යායේ පැවැත්මට ම තර්ජනය කිරීමට පෙරාතුව විසඳාගැනීමට හෝ අඩු වශයෙන් රඳවා තබා ගැනීමට ඉඩ සලසන තත්වයන් මාලාවක් පරිකල්පනය කර ගැනීම අතීතයේ සියලු ම ඓතිහාසික අත්දැකීම්වල එලියෙන් ගත් කල්හි යුක්ති යුක්ත ද?

අධිරාජ්‍ය පර්යායේ රාමුව ඇතුලත ප්‍රධාන ලෝක බලවතුන් අතර පවත්නා භූ-දේශපාලනමය සහ ආර්ථික ඝට්ටනයන්, ජාත්‍යන්තර දේශපාලනය ප්‍රගාඪ ලෙස අස්ථායී කර දමන්නා වූ ස්ථානය කරා සේන්දු වනවා පමනක් නො ව එතැන ඉක්මවා යාමට ද පෙර සාකච්ඡා සහ බහු-පාර්ශවීය එකඟතා පදනමේ විසඳාලනු ලැබීමට ඉඩකඩ පවතීය යි අපි විශ්වාස කරන්නෙමු ද?

ආර්ථික සංවර්ධනය සඳහා තීරනාත්මක වන, ඛනිජතෙල් හා ස්වභාවික වායූන්ට සුවිශේෂවත් සෙසු අමුද්‍රව්‍යවලටත් ලං වී ගැනීම සඳහා ද ඒවා පාලනය කිරීම සඳහා ද - ඇති වන තරගය ප්‍රචන්ඩ ඝට්ටනයන්ගෙන් තොරව විසඳා ලීම සම්භාව්‍යව සිදු විය හැක්කක් ද?

ප්‍රාදේශීය අනුහස සඳහා සිදු වන ගනන් නැති අරගල - චීනය සහ ජපානය නැත හොත් චීනය සහ ඉන්දියාව අතර ආසියාවේ ආධිපත්‍යය සඳහා සිදුවන්නා වූ අරගල සන්නද්ධ ඝට්ටනයන් ගෙන් තොරව විසඳාලිය හැකි ද?

භූගෝලීය ආර්ථිකය අතිමූලිකව අස්ථායි කිරීමේ විපාකය ඇති නො කොට ඇමරිකා එක්සත් ජනපදයට ඩොලර් ට්‍රිලියන ගනනක ප්‍රවර්තන ගිනුම් හිඟ දිගින් දිගට ම ගොඩගසාගෙන යා හැකි ද? ඇමරිකා එක්සත් ජනපදයේ පැන නගින මහා ආර්ථික අර්බුදයක් බරපතල මූල්‍ය කලබැගෑනියකින් තොරව උකහා ගැනීමට ලෝක ආර්ථිකය සමත්වේ ද?

එක්සත් ජනපදය තමන්ගේ අධිපතිවාදී අභිප්‍රායන්ගෙන් පසුබැස රාජ්‍යයන් අතර වඩාත් සමානාකාර ලෝක බල බෙදීමක් පිලිගනු ඇත් ද? යුරෝපයේ වේවා, ආසියාවේ වේවා ආර්ථික සහ විභව යුද්ධමය තරගකරුවන් සමග, සම්මුතියේ සහ සහන දීමේ පදනමක පසු බැසීමක් කිරීමට එක්සත් ජනපදය සූදානම් වනු ඇත් ද?

චීනයේ නැග එන අනුහස හිතෛෂීව සහ සාමකාමීව ඉවසා දරා සිටීමට ඇමරිකා එක්සත් ජනපදය සමත්වේ ද?

සමාජ අංශයේ ලා ගත් කල්හි බරපතල සහ ප්‍රචන්ඩ මට්ටමක ඝට්ටන ඇති කරන්නේ නැතිව ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපය සහ ආසියාව පුරා සමාජ අසමානතාවය කම්පාකාරී ලෙස පැතිර යාම දිගින් දිගට ම සිදු වෙමින් පවතිනු ඇත් ද? තමන්ගේ ජීවන මට්ටම් නොකඩවා පහතට ඇද වැටීම බරපතල හා කටුක විරෝධයකින් තොරව දශක ගනනාවක් තිස්සේ උසුලාගෙන සිටීමට ඇමරිකානු කම්කරු පන්තිය සූදානම් වනු ඇතැයි යන මතයට එක්සත් ජනපදයේ දේශපාලන සහ සමාජ ඉතිහාසය දෙස් දෙන්නේ ද?

ලෝක ධනවාදය ප්‍රසාරනයේ හා ස්ථාවරත්වයේ නව ස්වර්නමය යුගයකට ඇතුලු වී ඇතැයි නිගමනය කිරීමට පෙර උත්තර දිය යුතුව ඇත්තේ ඉහත සඳහන් ජාතියේ ප්‍රශ්නයන්ට ය.

ඉහත සඳහන් ප්‍රශ්න සියල්ලට ම 'ඔව්' යයි පිලිතුරු දෙන අය ඉතිහාසයේ පාඩම්වලට එරෙහිව බරපතල පරදුවක් තබන්නාහ.

ඉදිරියේ එන සතිය තුල සාකච්ඡාවට බඳුන් වනු ඇත්තේ මෙම ප්‍රශ්නයන් ය. (*ලෝක සමාජවාදී වෙබ් අඩවි විමර්ශන*. 9 කලාපය, 2006 අප්‍රේල්-ජූනි, කතුවැකිය, පිටු 2-3-4)

සමාජතයක් වශයෙන් මම ජාත්‍යන්තර කමිටු කර්තෘ මන්ඩලය මෙහෙයවාලූ විශ්ලේෂන විධික්‍රමය සැකෙවින් පැහැදිලි කලෙමි:

මෙම සතියේ අප කැප වී ගන්නා ප්‍රධාන කාර්යය නම් ලෝක ධනේශ්වර පද්ධතියේ වේගයෙන් වර්ධනය වන අර්බුදයේ ප්‍රධාන ලක්ෂන පිලිබඳ දල සටහනක් සම්පාදනය කර ගැනීම ය.

1914 දී ලෙනින් මෙසේ ලිවීය: 'අපෝහකයේ සාරය (නොවෙතොත් සාරභූතයන්ගෙන් එකක්, ප්‍රධානතම විලක්ෂනය නො වේ නම් විලක්ෂනයන්ගෙන් එකක්) වනාහි ඒකීය සමස්තයක් විභේදනය කොට එහි පරස්පර විරෝධී අංග ඥානනය කිරීම ය.'

මෙම න්‍යායික ප්‍රවිෂ්ටයට අනුව, අපට (ඉදිරි දිනවල දී) අසන්නට ලැබෙනු ඇති වාර්තා විසින් භූගෝලීය අර්බුදයේ වර්ධනය එහි විවිධ අංශයන් සහ පැතිවලින් පරීක්ෂා කරනු ඇත." (එම - පි. 5.)

මගෙ ප්‍රාරම්භක සමර්පනයන්ට ඉක්බිති

1. ලෝක ධනේශ්වර ආර්ථිකයේ වත්මන් තත්වය පිලිබඳ නික් බීම්ස්ගේ වාර්තාව - එය 20 වන ශතවර්ෂයේ ගෝලීය ආර්ථික පද්ධතිය තුල ඇමරිකා එක්සත් ජනපදයේ තීරනාත්මක සහ සංකීර්න භූමිකාවේ සන්දර්භයෙහි වත්මන් (ලෝක) සංසන්ධිය පිහිටුවාලී ය.
2. ජේම්ස් කොගාන්ගේ "ඉරාකයට එරෙහි ඇමරිකානු-නීත යුද්ධයේ විපාකයන්'' පිලිබඳ විශ්ලේෂනය.
3. "බුෂ් පාලනාධිකාරය සහ එක්සත් ජනපද ධනවාදයේ ගෝලීය පරිහානිය'' පිලිබඳ බැරි ග්‍රේගේ වාර්තාව.
4. "එක්සත් ජනපදයේ සමාජ සහ දේශපාලන අර්බුදය සහ 2006 සසප මැතිවරන ව්‍යායාමය" පිලිබඳ පැට්‍රික් මාටින්ගේ පරීක්ෂනය.
5. "ලෝක සමාජවාදය සඳහා චීනයේ අනුෂංගයන්" පිලිබඳ ජෝන් චැන්ගේ

අධ්‍යයනය.

6. උල්රිච්-රිපර්ට් ඉදිරිපත් කල "යුරෝපීය ධනවාදයේ මෘතාන්තය සහ කම්කරු පන්තියේ කර්තව්‍යයන්" පිලිබඳ වාර්තාව
7. ජූලි හයිලන්ඩ්ගේ "නිව්-ලේබර් පක්ෂය සහ බ්‍රිතාන්‍යය තුල ප්‍රජාතන්ත්‍රවාදයේ පිරිහීම" පිලිබඳ වාර්තාව.
8. "ලතින් ඇමරිකානු ඉදිරිදර්ශන" පිලිබඳ බිල් වැන් ඕකන්ගේ වාර්තාව.
9. "වත්මන් තත්වය තුල කලාත්මක සහ සංස්කෘතික ගැටලු" පිලිබඳ ඩේවිඩ් වොල්ෂ්ගේ වාර්තාව.
10. රිචර්ඩ් හොෆ්මන්ගේ "ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ ව්‍යවස්ථානුකූලවාදයට එරෙහි ප්‍රහාරය" පිලිබඳ විශ්ලේෂනය.
11. "දකුනු ආසියාව සහ ධනේශ්වර ජාතිකවාදයේ ද ස්ටැලින්වාදයේ ද දේශපාලන බංකොලොත්භාවය" පිලිබඳ විජේ ඩයස්ගේ වාර්තාව.
12. "අප්‍රිකාව සහ ජාත්‍යන්තර සමාජවාදය පිලිබඳ ඉදිරි දර්ශනය" පිලිබඳ රිචර්ඩ් ටයිලර්ගේ පරීක්ෂනය.
13. ජීන් පෝල් විසින් කරන ලද "සියොන්වාදී ව්‍යාපෘතිය නිර්මානය කල ආර්ථික, සමාජ හා දේශපාලන ව්‍යසනය"

ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් කුමන වාර්තාවක් හෝ පිලිබඳව කීමට මොනවාවත් ඔබට ඇත්තේ නැත. ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ රැස්වීම් ආරම්භයේ දී මා මතු කල කුමන ප්‍රශ්නයකට හෝ පිලිතුරක් ඔබ ඉදිරිපත් කරන්නේ නැත. එම වාර්තාකරුවන්ගේ විශ්ලේෂනයන්ට ඔබ එකඟ ද නැත් ද යන්න වත් ඔබ ප්‍රකාශ කරන්නේ නැත. නික් බීම්ස් සහෝදරයා ලෝක ධනවාදයේ වර්ධනය පිලිබඳ පෘථුල සමාලෝචනයක් ඉදිරිපත් කර, ලෝක පද්ධතිය ඇතුලත පවත්නා අසමතුලිත තාවය විශේෂයෙන් ම අවධාරනය කරමින් අන්තර්-අධිරාජ්‍ය සම්බන්ධතාවන්ට ද ජාත්‍යන්තර පන්ති අරගලයට ද යන දෙකට ම ඉන් ගම්‍ය වන දූරගාමී අනුෂංගයන් විදහා දැක්විය. මෙම විශ්ලේෂනය ජාත්‍යන්තර කමිටුවේ ඉදිරිදර්ශනයන් සඳහා තීරක පදනමක් සම්පාදනය කරයි. මෙම වාර්තාව පිලිබඳ ඔබගේ නිෂ්ශබ්දතාවයට හේතුව කුමක් ද? කොගාන් සහෝදරයාගේ වාර්තාව ඉතා ම වැදගත් ජාත්‍යන්තර සිද්ධියට කැප කොට තිබුනි. ඒ සිද්ධිය නම් ඇමරිකාව විසින් ඉරාකය අල්ලා ගැනීම ය. ඔබගේ ලියවිල්ල මෙම වාර්තාවට කිසිසේත් සමර්පනය නො කරයි. ඔබ යුද්ධය පිලිබඳ ප්‍රශ්නය මතු කරන්නේ ද නැත. ඔබ කොගාන්ගේ විශ්ලේෂනය ගැන එකඟ ද නැත් ද? මා වාර්තා ලැයිස්තුව ඉදිරිපත් කල හොත් එක ම ප්‍රශ්නය යලි යලිත් ඉස්මතු කෙරෙනු ඇත. තම පෘථුල වාර්තාවල ජාත්‍යන්තර කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබූ දේශපාලන විශ්ලේෂනයේ කුමන අංශයක් හෝ ආමන්ත්‍රනය කිරීමට ඔබ අසමත් වන්නේ මන්ද? ඔබගේ තුෂ්නීම්භූත භාවය හුදෙක් නො තකා හැරීම යයි අර්ථකථනය කල නො හැකි ය. මෙහි දී සිදුවී ඇත්තේ වෛෂයික ලෝකය පිලිබඳව හැකිතාක් නිවැරදි වූ නිශ්චිත වූ විශ්ලේෂනයක් මත විප්ලවවාදී භාවිතය පිහිටුවාලීමට යත්න දරන්නා වූ ඉදිරි දර්ශනය පිලිබඳ මාක්ස්වාදී සංකල්පය මුලුමනින් ම ප්‍රතික්ෂේප කිරීම ය. ඔබට නම් එවැන්නක් වනාහි කාලය කා දැමීමකි. ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ දී ඉදිරිපත් කරන ලද වාර්තා මොන ම ආකාරයකට වත් ඔබ "සමාජවාදී විඥානය ය"යි හඳුන්වන දෙයට සම්බන්ධ යයි ඔබ විශ්වාස නො කරන්නෙහි ය. අප මීන් ටිකකට පසුව වඩාත් සවිස්තරව පැහැදිලි කරන පරිදි මෙම පදයෙන් ඔබ අදහස් කරන දෙය වනාහි මාක්ස්වාදයේ ප්‍රශස්ත ම නියෝජකයන්ගේ කාර්යයන් ප්‍රොත්සාහී කලා වූ විප්ලවවාදී විඥානය පිලිබඳ සංකල්පයෙන් ප්‍රගාඪව වෙනස් වන්නකි. ඔබට අවශ්‍යව පවතින්නේ ජාත්‍යන්තර කමිටුව ප්‍රාථමිකව ම දේශපාලනය සහ ඉතිහාසය පිලිබඳව නො ව - විශේෂයෙන් ම විල්හෙල්ම් රීක් සහ හර්බට් මාර්ක්‍යුස්ගේ කෘතිවල මෙන් - මනෝවිද්‍යාව සහ ලිංගිකත්වය පිලිබඳව උත්සුක වී ගැනීම ය. ඔබට "සමාජවාදී විඥානය" සහ "සමාජවාදී පරමාර්ථවාදය" පදනම් කල යුතු වූ විෂයයන් වන්නේ ඉහත සඳහන් ඒවා ය. ඔබ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලය විසින් කර ගෙන යනු ලබන වැඩ කටයුතුවලට හිරිකිත නො තැකීමකින් ප්‍රතිචාර දක්වන්නේ ඒ නිසා ය. භූගෝලීය පද්ධතියක් ලෙස ධනවාදයේ ඓතිහාසිකව වර්ධනය වූ සමාජ-ආර්ථික හා දේශපාලන ප්‍රතිසතිතාවන් පිලිබඳ අධ්‍යයනයක් මත පදනම්ව ලෝක විප්ලවවාදී ඉදිරි දර්ශනයක් විස්තාරනය කිරීමට ජාත්‍යන්තර කමිටුව දරන්නා වූ ප්‍රයත්නය මුල් ඇද තිබෙන්නේ ඔබ සාකල්‍යයෙන් ම විරසකව සිටුනා මාක්ස්වාදී දේශපාලන සම්ප්‍රදාය තුල ය.

**මතු සම්බන්ධයි**

**සටහන්**

1. ස්ටයිනර් සහෝදරය, ඔබ වර්කර්ස් ලීගය හැර ගියේ 1978 සැප්තැම්බරයේ දී ය. බ්‍රෙනර් සහෝදරය, ඔබ 1979 ජනවාරියේ දී ඉල්ලා අස්වූයෙහි ය.

2. 1998 දී රොබට්සන් කන්ඩායම මෙසේ ලිවීය: "සසප නව වෙබ් අඩවිය ඩේවිඩ් නෝර්ත්ගේ වායුමය "මහා චින්තනය" හරහා වේගයෙන් ප්‍රසාරනය වෙමින් පවතී. එය, දූවැන්ත අහංකාරයකින් ද, සැක කටයුතු දේශපාලනයකින් ද යුත් අඩව්-ඉරියව් පාන අලු පැහැ පුංචි මිනිසුන් විප්ලව සෙල්ලමේ යෙදෙන යථා'සම මනස්සෘෂ්ටික ලෝකවලින් සැදුනු කුනු කන්දල් කක්ෂ වලල්ලක බිහිව ඇති නවතමය යි... සයිබර් අවකාශයට යම් ලියැවිලි ටිකක් හලා දැමීම සැබෑ ලෝකයේ සැබෑ මිනිසුන් අතර කෙරෙන... දෘඩ අරගලයට ද, විප්ලවවාදී කම්කරු පක්ෂයක් ගොඩ නැගීමට ද ආදේශකයකැයි සිතීම හුදෙක් තහවුරු කරන්නේ නෝර්ත්වාදීන් කුප්‍රකටව සිටින නරුමභාවයේ හා තක්කඩිකමේ ද ගැඹුර පමනෙකි.''

3. http://www.wsws.org/sections/category/about/about.shtml

© www.wsws.org